සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** # බුද්ධ ධර්මය - I **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. ලොව්තුරා බුද්ධත්වයට පත් වීම ම, අතිශය දුෂ්කර අභියෝගයකි. එම අභියෝගය ජයග්‍රහණය කිරීමෙන් පසු කළ ප්‍රථම උදාන වැකිය වූයේ,
    (1) "අග්ගෝ හමස්මි ලෝකස්ස - ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස" යන්නයි.
    (2) "හන්දදානි භික්ඛවේ වෝ වය ධම්මා සංඛාරා" යන්නයි.
    (3) "අනේකජාති සංසාරං - සන්ධා විස්සං අනිබ්බිසං" යන්නයි.
    (4) "සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා" යන්නයි.

02. වැසිකිළි පරිහරණයේ දී බඳුනේ ජලය ස්වල්පයක් ඉතිරි කිරීම මුල්කොට ගෙන ධර්මධර හා විනයධර භික්ෂූන් වහන්සේලා දෙපිරිසක් අතර ඇති වූ කලහකාරී හැසිරීමට හේතු වූ විහාරය වන්නේ
    (1) සැවැත් නුවර ජේතවනාරාමය යි. (2) කොසැඹෑ නුවර ඝෝෂිතාරාමය යි.
    (3) මගධයේ වේළුවනාරාමය යි. (4) කෝසලයේ රාජකාරාමය යි.

03. බුදුරජාණන් වහන්සේ පස් වන වස් කාලය ගත කළේ,
    (1) විශාලා මහනුවර කූටාගාර ලෙනෙහිය (2) මකුල පර්වතයෙහිය
    (3) පාරිලෙය්‍ය වනයෙහිය (4) චාලි පර්වතයෙහිය

04. අඟුල්මල් නාලාගිරි ආලවක වැනි අයට පිහිට වීමෙන් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේ තුළ පැවති.
    (1) අසරණ සරණ ගුණයයි. (2) පුරිසදම්ම සාරථී ගුණයයි.
    (3) තාදී ගුණයයි. (4) ගිලනුන්ට උවටැන් කිරීමේ ගුණයයි.

05. මනා වූ පිළිවෙත් පුරන බැවින් මහා සංඝ රත්නය.
    (1) උජුපටිපන්න නම් වේ. (2) ආහුනෙය්‍ය නම් වේ.
    (3) සුපටිපන්න නම් වේ. (4) දක්ඛිණෙය්‍ය නම් වේ.

06. බෝසතාණන් වහන්සේ දාන උපපාරමී පාරමිතාව පූරණය කළ බව හෙළිවන ජාතක කථාව,
    (1) වෙස්සන්තර ජාතකයයි. (2) සස ජාතකයයි.
    (3) තේමිය ජාතකයයි. (4) සිවි ජාතකයයි.

07. ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු දැන ඇති කර ගන්නා පැහැදීම.
    (1) අමූලිකා ශ්‍රද්ධාව නම් වේ. (2) භක්තිය නම් වේ.
    (3) තුන්තරා බෝධිය නම් වේ. (4) අවෙච්චප්පසාදය නම් වේ.

08. "ප්‍රමාණය දැන ආහාර වැළඳූ විට ආහාර සෙමින් දිරයි ඔවුන්ගේ ආයුෂය වැඩෙන්නේ ය." යන අදහස දේශනා කළේ කුමන සූත්‍රයේ දී ද?
    (1) සිඟාලෝවාද සූත්‍රයෙනි. (2) මංගල සූත්‍රයෙනි.
    (3) දෝණපාක සූත්‍රයෙනි. (4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙනි.

09. "යමෙකු පව් කළොත් එයින් ඔහු ම කෙලෙසෙන්නේ ය. පව් නොකළොත් එයින් ඔහු ම පිරිසිදු වන්නේ ය. මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
    (1) "තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති" යන්නයි.
    (2) "අත්තනාව කතං පාපං - අත්තනාව සංකිලිස්සති" යන්නයි.
    (3) "නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති" යන්නයි.
    (4) "උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ" යන්නයි.

10. සිතෙහි පවතින නොසන්සුන් බව විසිරුණු ගතිය සෙලවෙන ගතිය ධර්මයේ හැඳින්වෙන්නේ,

(1) උද්ධච්ච කුක්කුච්ච නමිනි. (2) විචිකිච්ඡාව නමිනි.

(3) කාමච්ඡන්දය නමිනි. (4) ව්‍යාපාදය නමිනි.

11. සමථ භාවනාව වැඩීමෙන් ලැබෙන උසස්ම ඵලයකි, පංච අභිඥා ලබාගැනීම. එම පංච අභිඥාවලින් එකක් ලෙස හඳුන්වන්නේ

(1) දිබ්බසෝත ඥානය ලබාගැනීම ය.

(2) මතක ශක්තිය දියුණු වීම හා එක අරමුණක සිටීමට හැකි වීමය.

(3) ගැටලු විසඳීමේ ශක්තිය හා වහා අවබෝධ කර ගැනීමේ හැකියාවයි.

(4) ඉවසීමේ ශක්තිය දියුණු වීම හා පිළිවෙලින් යමක් ඉදිරිපත් කිරීමේ හැකියාවය.

12. ක්‍රි. ව. 1906 ජනවාරි 08 වැනි දා පාසල් අධ්‍යාපනය නතර කර පැවිදි දිවියට ඇතුළත් වූ පින්වත් කුමාරයා වූයේ,

(1) කුලතුංග බණ්ඩාර ය. (2) රූබෙල් ගුණවර්ධන ය.

(3) දොන් ඩේවිඩ් හේවාවිතාරණ ය. (4) හෙන්රි ස්ටීල් ඕල්කට් ය.

13. යමක් ඇසූ පමණින්, පරම්පරාවෙන් ආ පමණින් ආදි වශයෙන් නොපිළිගත යුතු බව දේශනා කළේ කවුරුන් හට ද?

(1) කෝලීය වංශිකයන්ට ය. (2) ශාක්‍ය වංශිකයන්ට ය.

(3) කේසපුත්තයේ කාලාමවරුන්ට ය. (4) ලිච්ඡවී වංශිකයන්ට ය.

14. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පහක් පිළිබඳව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. එම ආනිසංස ගණයට ඇතුළත් නො වන කරුණක් වන්නේ පහත කවරක් ද?

(1) කීර්ති ය පැතිරීම

(2) මරණින් මතු සුගතියෙහි උපත ලැබීම

(3) මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම

(4) සිහි මුලා වී කලුරිය කිරීම

15. "තණ්හා පච්චයා උපාදානං" යන්නෙන් පැහැදිලි කරන්නේ,

(1) සත්ත්වයා නැවත සසරට එකතුවීම නිසා සසර ඉපදීම සිදු වීමයි.

(2) ඉපදීම නිසා ජරා මරණාදියට පත්වීමයි

(3) සළායතන හේතු කොට ස්පර්ශය ඇති වේ

(4) තණ්හාව නිසා සිතින් දැඩිව අල්ලා ගැනේ

16. කුසලාකුසල කර්ම රැස් කිරීම හේතු කොට ගෙන ප්‍රතිසන්ධි සිත පහළ වේ." යන්න ප්‍රකාශ වන්නේ,

(1) "ඵස්ස පච්චයා වේදනා" මගිනි (2) "උපාදාන පච්චයා භවෝ" මගිනි

(3) "සංඛාර පච්චයා විඤ්ඤාණං" මගිනි (4) "අවිජ්ජා පච්චයා සංඛාරා" මගිනි

17. ජනක කර්මයේ විපාක දීමේ හැකියාව නැති කොට තමා ම විපාක ලබා දෙන කර්මය වන්නේ,

(1) උපපීඩක කර්මයයි (2) උපඝාතක කර්මයයි

(3) ජනක කර්මයයි (4) උපත්ථම්භක කර්මයයි

18. චූල්ලකම්ම විභංග සූත්‍රයේ දැක්වෙන පරිදි සත්ත්ව හිංසාව කිරීමෙන් ලැබෙන ප්‍රතිඵලය වන්නේ,

(1) බොහෝ ආබාධ සහිත ව උපදියි (2) දුර්වර්ණව උපදියි

(3) අඩු වයසින් මියයයි (4) ආබාධ රහිතව උපදියි

19 පඤ්ච ඉන්ද්‍රිය යනු

(1) රූප, වේදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණ ය.

(2) චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය ය.

(3) රූප ශබ්ද ගන්ධ රස, ස්පර්ශ ය.

(4) පඨවි, ආපෝ, තේජෝ, වායෝ ය.

20. බොරු කීම, කේලාම් කීම, හිස්වචන කීම හා රළු වචන කීම යන අකුසල් සතරින් වැළකීම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ කිනම් අංගයට ඇතුළත් වේද?

(1) සම්මා දිට්ඨියට ය. (2) සම්මා සමාධියට ය.

(3) සම්මා වාචාවට ය. (4) සම්මා ආජීවට ය.

21. දීඝජාණු කෝලිය පුත්‍රයාට දේශනා කළ මෙලොව දියුණුවට ඉවහල් වන කරුණු අතර අයවැය ගැන සැලකිලිමත්ව ධනය පරිහරණය කිරීම.

(1) සමජීවිකතා නම් වේ (2) ආරක්ඛ සම්පදා නම් වේ

(3) උට්ඨාන සම්පදා නම් වේ (4) කල්‍යාණ මිත්තතා නම් වේ

22. පළමු ධර්ම සංගායනාවේ දී ගත් ප්‍රබල ප්‍රතිඵලය ධර්මය මුඛ පරම්පරාගතව පවත්වා ගෙන යාමට භාණක පරම්පරාවලට පැවරීම ය. ඒ අනුව "අංගුත්තර නිකාය" භාර වූයේ මින් කවර භාණක පරපුරට ද?

(1) ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.

(2) අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.

(3) මහා කාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.

(4) සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට ය.

23. දුගී පවුලක උපත ලැබුව ද ඉහළ මට්ටමේ රූප ශෝභාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට හැකි බව දේශනා කළේ,

(1) උපධි සම්පත්තියෙනි. (2) ගති සම්පත්තියෙනි.

(3) ප්‍රයෝග සම්පත්තියෙනි. (4) කාල සම්පත්තියෙනි.

24. පාලකයකු විසින් රට වැසියන්ගේ යහපත සඳහා තම කාලය, ශ්‍රමය, ධනය, සුව පහසුව කැප කරන්නේ නම් එම දස රාජධර්ම වල හඳුන්වන්නේ,

(1) දානය ලෙසිනි. (2) පරිත්‍යාගය ලෙසිනි. (3) සීලය ලෙසිනි. (4) ඍජු බව ලෙසිනි.

25. තිදොරින් සිදු කරන දස අකුසල කර්ම අතර කාය කර්ම ගණයට අයත් නොවන කරුණක් වන්නේ පහත කවරක් ද?

(1) අදත්තාදානය (2) කාමමිථ්‍යාචාරය (3) ව්‍යාපාදය (4) ප්‍රාණඝාතය

26. පාලකයකු පසිඳුරන් පිනවීමට දවසේ වැඩි කාලයක් ගත කළ හොත් පාලිතයන් වෙනුවෙන් රට වෙනුවෙන් කළ යුතු යුතුකම් පාලකයා වෙතින් බැහැර විය හැකි බව දසරාජ ධර්ම වල හැඳින්වෙන්නේ,

(1) අක්‍රෝධය ලෙසිනි. (2) අවිරෝධතාව ලෙසිනි.

(3) මෘදු බව ලෙසිනි. (4) තපස ලෙසිනි.

27. "හරි හම්බ කරපු දේවල් දුක් මහන්සියෙන්, දනට පිනට ගෙදර දොරට දුන්නේ මං, සිතේ මනාපෙන්..." යන ගීතය ගායනා කරනු ලබන්නේ,

(1) ආචාර්ය අමරදේව ශූරීන් ය.

(2) විශාරද වික්ටර් රත්නායක ශූරීන් ය.

(3) විශාරද ගුණදාස කපුගේ ශූරීන් ය.

(4) විශාරද එඩ්වඩ් ජයකොඩි ශූරීන් ය.

28. මිය ගිය ඥාතීන්ට, යුතුකම් ඉටු කිරීම බුදු දහමේ හඳුන්වන්නේ,

(1) රාජ බලි නමිනි. (2) දේවතා බලි නමිනි.

(3) පුබ්බපේත බලි නමිනි. (4) ඥාති බලි නමිනි.

29. ෂඩ්භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත පොත් රැසකි. එම පොත් ගණයට ඇතුළත් නොවන්නේ මින් කවරෙක් ද?

(1) පරවි සන්දේශය (2) ගිරා සන්දේශය (3) කාව්‍යශේඛරය (4) සැළලිහිණි සන්දේශය

30. මංගල සූත්‍රයේ "අනවජ්ජානි කම්මානි" යන්නෙන් අවධාරණය වන්නේ,

(1) නිවැරදි රැකියා ය. (2) අකුසල කර්මය.

(3) කුසල කර්ම ය. (4) පහත් රැකියා ය.

31. මහින්දාගමනයෙන් ශ්‍රී ලංකිකයන් ලැබූ දායාද ගණයට අයත් නො වන කරුණ වන්නේ,

(1) අක්ෂර මාලාවක් ලැබීමයි. (2) භික්ෂු සමාජය ආරම්භ වීමයි.

(3) ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලැබීමයි. (4) ශ්‍රී දළදා වහන්සේ ලැබීමයි.

32. ස්ථූප ආකෘති ගර්භයේ ස්වරූපය අනුව ප්‍රධාන වශයෙන් ආකාර සයකි. ඒ අනුව "ඝටාකාර" යනු

(1) ඝණ්ඨාරයක හැඩයයි (2) කලයක හැඩයයි

(3) දිය බුබුලක හැඩයයි (4) නෙල්ලි ගෙඩියක හැඩයයි

33. කලා කෘති අතර බෝධිඝරයට සුවිශේෂී තැනක් බෞද්ධ කලාව තුළ හිමි වේ. ඒ අනුව කලාත්මක බෝධිඝරය වන්නේ,

(1) ශ්‍රී මහා බෝධිඝරයයි (2) කළුතර බෝධිඝරයයි

(3) නිල්ලක්කම බෝධිඝරයයි (4) ආනන්ද බෝධිඝරයයි

34. දකුණු අත උඩට නමා ඇඟිලි සම්පූර්ණයෙන් ම දිග හැර අත්ල ඉදිරියට සිටින සේ නිරූපණය කෙරෙන මුද්‍රාව වන්නේ

(1) විතර්ක මුද්‍රාවයි (2) අභය මුද්‍රාවයි (3) වරද මුද්‍රාවයි (4) ධ්‍යාන මුද්‍රාවයි

35. බුදුරජාණන් වහන්සේ ගේ නව අරහාදී බුදු ගුණ වර්ණනා කරමින් විද්‍යාචක්‍රවර්තී පඬිවරයා විසින් රචිත ග්‍රන්ථය නම්,

(1) බුත්සරණයි (2) අමාවතුරයි (3) ධර්මප්‍රදීප කාව්‍යයයි (4) පූජාවලියයි

36. "මා දෙන බතින් යැපෙන, මා සපයන යානයෙන් ගමන් යන, මා නිසා ජීවත් වන නමුදු ඔවුහු මා කෙරෙහි ගෞරව නොදක්වා ඔබ වහන්සේ කෙරෙහි ම ගෞරව දක්වූහ." මෙසේ බුදුරජාණන් වහන්සේ වෙත මෙම කරුණු ඉදිරිපත් කළේ,

(1) පසේනදි කොසොල් රජතුමා (2) මගධයේ බිම්බිසාර රජතුමා

(3) වත්සයේ උදේනි රජතුමා (4) අවන්තියේ චණ්ඩපජ්ජෝත රජතුමා

37. බෞද්ධ ආර්ය මාර්ගයේ පියවර තුන නම්,

(1) කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා ය.

(2) අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥා ය.

(3) සිත, කය, වචනය ය.

(4) ලෝභ, ද්වේශ, මෝහය.

38. අනාබද්ධ බුද්ධ ප්‍රතිමාවකට නිදසුනක් වන්නේ,

(1) අවුකන බුද්ධ ප්‍රතිමාව ය. (2) තොළුවිල බුද්ධ ප්‍රතිමාව ය.

(3) මාලිගාවිල බුද්ධ ප්‍රතිමාව ය. (4) සැස්සේරුව බුද්ධ ප්‍රතිමාව ය.

39. තෙවන ධර්ම සංගායනාවට නායකත්වය හා රාජ්‍ය අනුග්‍රහය ලබා දෙන ලද දෙපල වන්නේ,

(1) මහා කාශ්‍යප හිමි හා අජාසත්ත රජුය.

(2) රේවත හිමි හා කණිෂ්ක රජු ය.

(3) සබ්බකාමී හිමි හා කාලාශෝක රජුය.

(4) මොග්ගලි පුත්තතිස්ස හිමි හා ධර්මාශෝක රජුය.

40. "සම්බුදු සසුන බේරා ගැනීමට තවත් විසිපස් වතාවක් මේ දඹදිව ඉපදේවා" යන පැතුමෙන් යුතුව අපවත් වූ තෙරුන් වහන්සේ වන්නේ,

(1) රේරුකානේ චන්දවිමල මහ නාහිමි ය.

(2) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ය.

(3) වැලිවිට අසරණ සරණ සරණංකර මහ නා හිමියන් ය.

(4) සිරි දේවමිත්ත ධර්මපාල හිමියන් ය.

(ල. 1 × 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

01. i. සතර පෙරනිමිති පිළිවෙලින් නම් කරන්න.

ii. "සමග්ගා හෝථ මා විවදථ" මෙහි අදහස ලියන්න.

iii. සමථ භාවනාවෙන් ලබාගත හැකි උසස් ම ඵල මොනවාද?

iv. කයෙන් සිදුවන කුසල කර්ම මොනවා දැයි පහදන්න.

v. ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ සඳහන් "උට්ඨාන සම්පදාව" කෙටියෙන් පහදන්න.

vi. "දානං සීලං පරිච්චාග" මෙහි සඳහන් බෞද්ධ දේශපාලන ප්‍රතිපත්ති පෙන්වා දෙන්න.

vii. වැලිවිට සරණංකර සංඝරාජයන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

viii. පත්තකම්ම සූත්‍රයේ සඳහන් "පංචබලි" කෙටියෙන් පහදන්න.

ix. අණන සූත්‍රයේ සඳහන් "අත්ථි සුඛය" කෙටියෙන් හඳුන්වන්න.

x. පොළොන්නරු යුගයේ රචිත ග්‍රන්ථ මොනවා ද? (ල. 2 × 10 = 20)

02. i. බුද්ධ කාරක ධර්ම අතරින් දෙකක් නම් කරන්න.

ii. පාරමිතාවක් සම්පූර්ණ කිරීමේ දී ත්‍රිවිධාකාර ය. ඒවා ලියා එහි අර්ථය පහදන්න.

iii. සදාචාරවත් සමාජයකට පාරමිතා ගුණ ධර්මයන් ඉවහල් වන ආකාරයත්, එමගින් පුද්ගල ගුණධර්මයන් වර්ධනය වන ආකාරයත් පැහැදිලි කරන්න.

03. i. "සුකරානි අසාධූනි" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.

ii. එහි අර්ථය ලියන්න.

iii. ජීවිතයක් සාර්ථක කර ගැනීමට උපදෙස් දෙන ග්‍රන්ථයක් වශයෙන් ධම්මපදය කෙතෙක් දුරට ඉවහල් වේ දැයි අගයන්න. (ල. 2 + 3 + 5 = 10)

04. i. "යෝ පටිච්ච සමුප්පාදං පස්සති, සෝ ධම්මං පස්සති" මෙහි තේරුම ලියන්න.

ii. "අවිජ්ජා පච්චයා සංඛාරා" යන්න ධර්මානුකූලව විස්තර කරන්න.

iii. හේතුඵල දහම සසර දුක මෙන් ම සමාජගත දුක ඇතිවන හා නැති වන ආකාරය පැහැදිලි කිරීමට අදාළ කරගත හැකි දහමක් ලෙස ඇගයීමට ලක් කරන්න.

(ල. 2 + 3 + 5 = 10)


05. i. බුදු දහමට අනුව කර්මය හඳුන්වා ඇත්තේ කෙසේ ද?

ii. විපාක දෙන ආකාරය අනුව කර්මය කොටස් හතරකි. ඉන් තුනක් ලියා කෙටියෙන් හඳුන්වන්න.

iii. අප සිදු කරනු ලබන කුසලාකුසල කර්ම මේ භවයේ දී හෝ පසු අත්භවයක දී විඳීමට සිදු වේ. සියල්ල කර්මයෙන් සිදු නොවුව ද කර්මය ජීවිතයට බලපාන එක් සාධකයෙකි. "කුසල් දහම්" පෝෂණය කළ යුත්තේ කුමක් පිණිස ද යන්න පැහැදිලි කරන්න.

(ල. 2 + 3 + 5 = 10)

06. i. ගර්භයක හැඩය අනුව ස්තූපයක දැකිය හැකි ආකාර දෙකක් ලියන්න.




ii. ඉහත අංකිත කොටස් නම් කරන්න.

iii. මහින්දාගමනයත් සමඟ මෙරට ප්‍රචලිත වූ ශිල්ප කලාවන් ලොවක් මවිතයට පත් කරයි. මෙසේ අප මුතුන් මිත්තන්ගෙන් ලද දායාදයන් මතුවට ආරක්ෂා කිරීම අපේ යුතුකමයි. "අපේ උරුමයන් සදා සුරකිමු" යන මැයෙන් පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

(ල. 2 + 3 + 5 = 10)

07. පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.

1. පූජ්‍ය රේරුකානේ චන්දවිමල නාහිමි

2. ධර්ම සංගායනා

3. බෞද්ධ චිත්‍ර කලාව

4. සතර බ්‍රහ්ම විහරණ (ල. 5 + 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(2) | 3 -(1) | 4 -(2) | 5 -(3) | 6 -(4) | 7 -(4) | 8 -(3) | 9 -(2) | 10 -(1) |
| 11 -(1) | 12 -(2) | 13 -(3) | 14 -(4) | 15 -(4) | 16 -(3) | 17 -(2) | 18 -(1) | 19 -(2) | 20 -(3) |
| 21 -(1) | 22 -(2) | 23 -(1) | 24 -(2) | 25 -(3) | 26 -(4) | 27 -(4) | 28 -(3) | 29 -(2) | 30 -(1) |
| 31 -(4) | 32 -(2) | 33 -(3) | 34 -(2) | 35 -(1) | 36 -(1) | 37 -(2) | 38 -(3) | 39 -(4) | 40 -(4) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. මහල්ලෙක්, ලෙඩෙක්, මළකඳක්, පැවිදි රුවක් (අපිළිවෙලට ලියා ඇත්නම් ල. 01 ක් දෙන්න)

ii. සමගිවන්න, විවාද නොකරන්න.

iii. පංච අභිඥා, අෂ්ට සමාපත්ති

iv. ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය යන අකුසල වලින් වෙන්වීම

v. තමා කරන කවර හෝ රැකියාවක් උත්සාහයෙන්, (උට්ඨාන විරියාධිගතා) දැතේ මහන්සියෙන් (බහාබල පරිචිතා) දහදිය හෙළා (සේද, වක්ඛිත්තා) ධාර්මිකව (ධම්මිකා) ධාර්මික ක්‍රියා අනුගමනයෙන් (ධම්මලද්ධා)

vi. දානය, සීලය, පරිත්‍යාගය

vii. මුණිගුණාලංකාරය, සාරාර්ථ සංග්‍රහය, රත්නත්‍රය ප්‍රණාම ගාථා සන්නය, සතර බණ වර සන්නය.

viii. පංච බලි නම් යුතුකම් ඉටු කිරීමය

ඥාති බලි - නෑදෑයන්ට සැලකීම

අතිථි බලි - ආගන්තුක සත්කාරය

පුබ්බපේත බලි - මියගිය ඥාතීන්ට දන් දීම (පින්පෙත්දීම)

රාජ බලි - රජයට ඉටුකළ යුතු යුතුකම්

දේවතා බලි - දෙවියන්ට පින්දීම ආගමික කාර්‍යයන්

ix ධාර්මිකව උපයාගත් ධනයක් තමන්ට ඇතැයි සිතා යම් කෙනෙකු ලබන සතුට

x. අමාවතුර, ධර්ම ප්‍රදීපිකාව, බුත්සරණ, මුවදෙව්දාවත, සසදාවත, (ග්‍රන්ථ 4 ක් ලියා ඇතිනම් ලකුණු 02 ක් ලබා දෙන්න.)

(ලකුණු $2 \times 10 = 20$)

(02) (i) i. දාන, ශීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා, වීර්ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපේක්ෂා

ii. පාරමී - සියලු වස්තු දන්දීම

උප පාරමී - ශරීර අවයව දන්දීම

පරමත්ථ පාරමී - ජීවිතය කැපකිරීම දන්දීම

iii. දානය නම් පූජා සිද්ධියෙන් තමන්ට වඩා උසස් ශිලාදි ගුණ ධර්මයෙන් යුතු අයට ලබා දීම හෝ අනුග්‍රහ බුද්ධියෙන් අසරණ කම, අනුකම්පාව සලකා පරිත්‍යාග කිරීමය.

සීලය - කායික - වාචසික සංවරය ශීලයයි.

නෙක්ඛම්ම - පංච ඉන්ද්‍රියන් පිනවීමෙන් ඉවත්වීමය

ප්‍රඥාව - ජීවිතය හා ලෝකය පිළිබඳව යථාර්ථවාදීව බැලීම.

වීර්ය - උතුම් බලාපොරොත්තු ඉටුවන තුරු උත්සාහයෙන් ක්‍රියා කිරීමය.

ක්ෂාන්තිය - පුද්ගලයන්ගෙන් හා පරිසරයෙන් වන දුෂ්කරතා, කායික මානසික පීඩා ඉවසීමය.

සත්‍ය නම් - අනුන් මුලාවට පත් නොකිරීම සත්‍ය ගරුක වීමය.

අධිෂ්ඨාන - යහපත් අරමුණ ඉටුවන තෙක් සිත වෙනස් නොවී පවත්වා ගැනීමයි.

මෛත්‍රිය - මිතුරාට මෙන්ම සතුරාට ද මෙත් වැඩීම ද

උපේක්ෂාව - මැදහත් සිතින් අටලෝ දහමට මුහුණ දීම අපේක්ෂාවෙන් තොර වීම ද මේ අනුව පාරමිතා ධර්මයන් පිරීම තුන්තරා බෝධියෙන් එක්තරා බෝධියකට පැමිණ නිවන් දැකීමට හැකි වනවා මෙන්ම සදාචාරවත් සමාජයකට මග පෙන්වා දීමට ඉවහල් වේ. (ඉතිරි පිළිතුරු සඳහා ලකුණු 2,3, 5 වශයෙන්)

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

(03) i. "සුකරානි අසාධූනී - අත්තනෝ අහිතානි ච

යංවේ හිතං ච සාධුං ච - තං වේ පරම දුක්කරං"

ii. තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසුයි. යම් දෙයක් තමාට වැඩදායක ද යහපත පිණිස හෝ පවතී ද එවැනි දේ කිරීම ඉතා අපහසුයි.

iii. ධම්මපදය බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය හෙවත් අත්පොත සේ සැලැකේ. ත්‍රිපිටකයේ අඩංගු ධර්ම කරුණු වල සම්පිණ්ඩනයකි. ධම්මපද යේ දහම් කරුණු කාල, දේශ, ජාති, ආගම්, භේදයෙන් තොරව සියළු දෙනාට පරිහරණය කළ හැක.

ධම්මපදයේ ගාථා 423 කි. වග්ග 26 කි. දැහැමි ජීවිතයක් ගත කිරීමට ඉවහල් වන කවරකුට වුව ද ඉවහල් වේ. එසේම සිත් තැවුල් මානසික පීඩාවලින් මිදීම සඳහා ද දුක් පීඩා අවුල් වියවුල් නිරාකරණය කර ගැනීම සඳහා ද තම සිතේ අභ්‍යන්තර ස්වරූපය තේරුම් ගෙන එ සිත පිරිසිදු කර ගැනීම සඳහා ද හිත හික්මවා ගැනීමේ වැදගත් කම ද පැහැදිලි කෙරේ. අපේ ජීවිත සාර්ථක කර ගැනීමට ඇසුරු කළ යුත්තෝ හා නොකළ යුත්තෝ කවුරුන්ද යන්නක් ධම්ම පදයෙන් කියා දේ. මේ සියල්ල තුළින් පුද්ගල ජීවිතයක් සාර්ථක වීමට ඉවහල් වේ.

(04) i. යමෙක් පටිච්ච සමුප්පාදය දකියි ද හේ ධර්මය දකී.

ii. අවිද්‍යාව නිසා කුසලා - කුසල කර්ම රැස් කරයි. (සංස්කාර) අවිද්‍යාව දුරු කොට කර්ම අවසන් කළ හැක. චතුරාර්‍ය සත්‍යය අවබෝධ කොට නිවන් ලැබිය හැක. කුසලා කුසල කර්ම රැස් කරන්නේ අවිද්‍යාව හෙවත් මෝඩකම නිසාය. චතුරාර්‍ය සත්‍ය නොදැනීමෙන් පුද්ගලයා සංස්කාරික දුක ඇති වේ.

iii. හේතුඵල දහමින් සසර දුක ඇති වන ආකාරයක් එය නැතිවන ආකාරයත්, පැහැදිලි කෙරේ. අනුලෝම පටිච්ච සමුප්පාදයෙන් සසර දුක ඇතිවන ආකාරය විස්තර කරන අතර පටිලෝම පටිච්ච සමුප්පාදයෙන් දුක නැති වන අයුරු විස්තර කෙරේ.

සසර දුක පමණක් නොව සමාජයක දුක ඇතිවනහා නැතිවන ආකාරය ද හේතුඵල දහමින් පැහැදිලි කෙරේ. දුප්පතුන්ට ධනය නොලැබුන විට දිළිඳුකම ඉහළ යන ආකාරයත්, ඉන් සොරකම ඇතිවන ආකාරය ද බුදු දහමේ පැහැදිලි කෙරේ. ඒ අනුව සමාජගත දුක ඇතිවන ආකාරය ද පැහැදිලි වේ.

(05) i. "චේතනාහං භිකඛවේ කම්මං වදාමි. චේතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා"

"චේතනාව කර්ම යැයි කියමි. සිතින් සිතා කයින්, වචනයෙන්, මනසින් කර්ම සිදු කරයි."

ii. 1. ගරුක - වෙනත් කර්ම වලින් වළකාලිය නොහැකි බලවත් කුසල අකුසල කර්ම

2. ආසන්න - මරණාසන්නයේ කලින් සිතට නැගුන කුසල අකුසල කර්ම

3. ආචිණ්ණ - පුරුද්දක් ලෙස නිතර සිහි කරන ලද කුසල අකුසල කර්ම

4. කටත්තා - දැඩි චේතනාවෙන් තොරව අසම්පූර්ණ කුසල අකුසල කර්ම

iii. කර්මය බුදු දහමේ ප්‍රධාන ඉගැන්වීමකි. පුද්ගල චේතනාව පෙරටු කොට කයින්, වචනයෙන් මනසින් කර්ම එක් රැස් කෙරේ. අකුසල සඳහා අකුසල සිතිවිලි මුල් වේ. කුසල කර්ම සඳහා කුසල සිතිවිලි මුල් වේ. අකුසලයෙන් වෙන්ව කුසල් දහම් වැඩීමෙන් මෙලොව - පරලොව ජීවිත සාර්ථක වේ.

යම් බීජයක් වපුරා ඒ අනුව ඵල ලැබේ. එසේම යහපත් සිතින් ක්‍රියා තුළින් යහපත් විපාක ලැබේ.

(06) i. ඝණ්ඨාකාර, ඝටාකාර, බුබ්බුලාකාර, ධාන්‍යාකාර, පද්මාකාර අම්ලකාකාර

ii. 1. කොත (චූඩා මාණික්‍යය)

2. කොත් කැරැල්ල

3. දේවතා කොටුව

4. හතරැස් කොටුව

5. ගර්භය

6. තුන් මහල් පේසාව

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

iii. මිහිඳු මහ රහතන් වහන්සේ ගේ ලංකාගමනයෙන් පසුව සංඝමිත්තා තෙරණිය ඇතුලු අටලොස් කුලයක ශිල්ප ශ්‍රේණි පැමිණීම නිසා මෙරට ජනයාට උරුමයන් රාශියක් දායාද විය. චිත්‍ර, මූර්ති, කැටයම් ගෘහ නිර්මාණ ඇතුළු කලා ශිල්ප මෙහිලා ප්‍රධාන වේ. ලොවක් මවිත කරවන අපේ පැරණි උරුමයන් අගේ කළ යුතු සේම ඒවා ආරක්ෂාකර ගැනීමට ලොකු - කුඩා සියලු දෙනාගේ යුතුකමකි. වගකීමකි.

පුරාවස්තු මංකොල්ලය, නිධන් හැරීම, පුරාවස්තු භූමි විනාශ නොකිරීම, අපවිත්‍ර නොකිරීම සඳහා අවදියෙන් සිටිය යුතුයි. යුධමය ගැටුම් වලදී පුරා වස්තු විනාශ වීමට ඉඩ නොදීම මෑත කාලයේ දී සීගිරි කුරුටු ගී පවුරේ නම් ලිවීම ආදිය එබඳු විනාශයන් අතර ප්‍රධානය, සර්වකාලීන වටිනාකම අවබෝධ කරගෙන අපේ බෞද්ධ උරුමයන් ආරක්ෂා කිරීම යුග මෙහෙවරකි.

(07) i. 1897 ජූලි 19 දින රූබෙල් ගුණවර්ධන නමින් උපත ලැබීය. 1906 ජනවාරි 08 දින බුරුමයේ විනයාලංකාර හිමි වෙතින් පැවිදි වියට ඇතුළත් වූයේ රේරුකානේ චන්දවිමල හිමි නමිනි.

වසර 10 ක් බුරුමයේ ඉගෙනුම ලබා 1917 ඔක්තෝම්බර් 26 දින බුරුමයේ ධම්මකාරාම සීමාවේ දී උපසම්පදාව ලැබීය. ලියන දේ එක වතාවෙන්ම ලියා මුද්‍රණයට යැවීම උන්වහන්සේගේ හැකියාව විය.

පොහොය දින ග්‍රන්ථය, ධර්ම විනිශ්චය, බෞද්ධයාගේ අත්පොත, පාරමිතාප්‍රකරණය, අභිධර්ම මාර්ගය, උන්වහන්සේ ලියන ලද ග්‍රන්ථ අතර ප්‍රධාන වේ. පාලි සිංහල, සංස්කෘත, බුරුම ආදී භාෂා රාශියක් දැන සිටි උන්වහන්සේ "සම්මාන පණ්ඩිත" උපාධිය ද කැලණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය පදවිය හා 1963 දී සාහිත්‍ය චක්‍ර වර්ති උපාධිය ද පිරිනමන ලදී. 1976 ශ්‍රී ලංකා ශ්වේජින් නිකායේ මහානායක පදවිය ද 1995 දී අමරපුර මහා මහොපාධ්‍යාය ශාසන ශෝභන ගෞරව නාමය ද පිරිනැමිය. 1997 ජූලි 04 දින උන්වහන්සේ අපවත් විය.

ii. ධර්ම සංගායනා මගින් ශාසනයේ සුරක්ෂිත බව ඇතිවේ. බුද්ධ වචනය නිර්මලව ආරක්ෂාකර ගැනීමටත් ඊට දුර්මත එක්වීමෙන් ඇති විය හැකි හානි වලක්වා ගැනීමටත් සංගායනා මගින් හැකි වේ. එසේම ධර්මය සංග්‍රහකොට ඒ ඒ භික්ෂු පරම්පරාවලට කටපාඩමින් ගෙනයාමට අවස්ථාව සැලැසීම තුළින් ද ධර්මය හා විනය අඛණ්ඩව පවත්වාගෙන යාමට ඉඩ සැලසිනි. භාරතයේ පැවැති ථෙරවාදි සංගායනා තුනෙන් හා මාතලේ අළුවිහාරයේ දී පැවැත් වූ ත්‍රිපිටක පුස්තකරූඪ කිරීමේ සංඝායනාවෙන් ද ශාසනයේ චිරස්ථිතිය හා සුරකින බව ඇතිවීමට හේතු විය.

iii. බුදු සිරිත් සුවිශේෂී අවස්ථා හා බෝසත් සිරිතේ යම් යම් සිද්ධි ඇතුලත් ජාතක කථා පාදක කොට ගෙන අනුරාධපුර යුගයේ සිට නූතන යුගය දක්වාම ශ්‍රී ලාංකික කලා ශිල්පීන් අතින් නිමවූ සිතුවම් අති විශිෂ්ඨය. සීගිරිය, හිඳගල්, දෙගල්දොරුව දඹුල්ල රිදී විහාරය, කැලණි විහාරය වැනි ස්ථානවලින් එදා මෙදා තුර ලාංකික චිත්‍ර කලාවේ විශිෂ්ඨතාවය හඳුනාගත හැක.

iv. සිව් බඹ විහරණ හෙවත් (චතු අප්පමඤ්ඤා)

1. මෙත්ත - සියලු සත්වයා වෙත දක්වන ලද හිතවත් කම
2. කරුණාව - දුකට පත් වුවන් දැක දුකින් මුදවා ගැනීමය
3. මුදිතාව - අනුන්ගේ දියුණුව දැක සතුටට පත් වීමයි ඊර්ෂ්‍යා නොකිරීමයි.
4. උපේක්ෂාව - මැදිහත් සිතින් කටයුතු කිරීමය. අපේක්ෂා වෙන් තොරව කටයුතු කිරීමයි.